**අධ්‍යාපන අංශය සංවර්ධනය කිරීමේ වැඩසටහන (ඊඑස්ඩීපී) - පළාත් මට්ටම - 2013**

---

අධ්‍යාපන අංශය සංවර්ධනය කිරීමේ වැඩසටහන (ඊඑස්ඩීපී) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තා, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ආසියානු සංවර්ධන බැංකුව (ආසංබැ) අතර 2013 අගෝස්තු 19 දින එළඹි අංක 3008 ශ්‍රී සාමාන්‍ය මෙහෙයුම් හා අංක 3009 එස්ආර්අයි විශේෂ මෙහෙයුම් ගිවිසුම්වල iv වගන්තියේ 4.04 ඡේදය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ණය ගිවිසුම් වලට අනුව අධ්‍යාපන අමාත්‍යාංශය (අධ්‍ය.අමා.) හා සියලුම පළාත් සභා විසින් වැඩසටහනේ පළාත් මට්ටමේ කාර්යයන් සිදුකිරීමට බලාපොරොත්තු වේ. අධ්‍යාපන අමාත්‍යාංශය හා සියලුම පළාත් සභා විසින් සිදුකල කාර්යයන් සම්බන්ධ අදහස් දැක්වීම් මෙම වාර්තාවේ අඩංගුවේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ණය ගිවිසුම් වලට අනුව, රටේ සමාන්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රය මුහුණ දෙන අභියෝග දුරුකිරීමට 2013-2017 අධ්‍යාපන ක්ෂේත්‍ර සංවර්ධන කාර්යය රාමුවක් සහ වැඩසටහන් (ඊඑස්ඩීඑෆ්පී) ක්‍රියාත්මක කිරීමට මූල්‍ය සහයෝගය ලබාදීම සඳහා ඊඑස්ඩීපී ක්‍රියාත්මක කර ඇත. අධ්‍යාපන අමාත්‍යාංශය ඊඑස්ඩීපී ක්‍රියාත්මක කිරීමේ ආයතනය වේ. ඊඑස්ඩීඑෆ්පී අනුව, ද්විතීක පාසල් වල පිරිමි හා කාන්තා උපාධිධාරී සේවා නියුක්තිය ඉහල නංවන නවීන ද්විතීක පාසල් අධ්‍යාපන ක්‍රමයක් වැඩිදියුණු කිරීම වැඩසටහනේ අරමුණු වේ. ණය ගිවිසුම් වලට අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 200 ක් වේ. වැඩසටහනේ කාර්යයන් 2013 අගෝස්තු 19 ආරම්භ කරන ලද අතර 2018 අගෝස්තු 31 සම්පූර්ණ කිරීමට සැලසුම් කර තිබේ.

## 1.3 ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තා සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

අධ්‍යාපන අමාත්‍යාංශයේ (අධ්‍ය.අමා), විභාග දෙපාර්තමෙන්තුවේ (වි.දෙ) සහ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමෙන්තුවේ (අධ්‍ය.ප්‍ර.දෙ) විසර්ජන ගිණුම් සංස්කරණය කිරීමෙන් මෙම ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තා පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තා පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත්, යෝග්‍ය මුදල් රෙගුලාසි හා මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ තෝරා ගැනීම සහ යොදා ගැනීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය හා මතය සඳහා පදනම

---

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තා පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද පළාත් සභා නවයේ ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. පළාත් සභා නවයේ ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න

පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදුකරන ලදි. ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තාවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම, ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තාවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදි. ඒ අනුව, මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම් ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල වැඩසටහන් කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ වැඩසටහනේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල් වලින් අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා දරන ලද වියදම, මූල්‍ය හා භෞතික වශයෙන් වැඩසටහනේ ප්‍රගතිය, මෙහෙයුම් කටයුතු වලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය මුදලින් මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ අධ්‍යාපන ක්ෂේත්‍රයේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) මුදල් රෙගුලාසි (මුරෙ) 150 සහ 2013 දෙසැම්බර් 06 දිනැති මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 233/2013 ට අනුකූලව ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තා පිළියෙල කර තිබුණේද යන බව.

(ඊ) ආසංබැ ට පිළිගත හැකි ගිණුම් ප්‍රතිපත්ති වලට අනුව ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තා පිළියෙල කර තිබුණේද යන බව.

(උ) තැන්පතු ගිණුමේ මූලික තැන්පතුව, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා ඌනපූර්ණය කිරීම් මහා භාණ්ඩාගාරය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඌ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතින්වලට අනුකූල වූයේද යන බව.

## 3. මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 5 ජේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැර , මාගේ මතය වනුයේ

(අ) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද පළාත් සභා නවයේ 2013 වර්ෂයේ විසර්ජන ගිණුම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 150 සහ 2013 දෙසැම්බර් 06 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 233/2013 හි සඳහන් විධිවිධාන වලට අනුකූල වන පරිදි පිළියල කර ඉදිරිපත් කර ඇත. ඉහත විසර්ජන ගිණුම් භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත, වාර්ෂික අයවැය ඇස්තමේන්තු හා පොත්, පළාත් සභා නවය නඩත්තු කරන ලේඛන හා වාර්තා සමඟ එකඟ වේ.

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව.

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 4. මූල්‍ය ප්‍රකාශන

---------------

### 4.1 මූල්‍ය කාර්ය සාධනය

----------------------

ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තා සහ වැඩසටහන විසින් ලබාදුන් තොරතුරු වලට අනුව, සමාලෝචිත වර්ෂය තුල සියලු ප්‍රභවයන්ගෙන් අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා දරන ලද මුළු වියදම රු. 84,592,467,000 ක අගයක් විය. 2013 වර්ෂය සඳහා පළාත් සභා නවයේ අධ්‍යාපන අමාත්‍යාංශවල විසර්ජන ගිණුම්වල දැක්වෙන ආකාරයට සියලු අරමුදල් ප්‍රභවයන්ගෙන් දරන ලද වියදම්වල සාරාංශයක් පහත වගුවෙන් දැක්වේ.

| විස්තරය | සමාලෝචිත වර්ෂය තුල සියලුම මූලාශ්‍රයන්ගෙන් ලද අරමුදල් වලින් දරන ලද වියදම |
|---|---|
| | Rs. |
| පුනරාවර්තන වියදම් | |
| පෞද්ගලික වේතන | 80,358,783,000 |
| මූලධන වියදම් | 4,233,684,000 |
| | 84,592,467,000 |

**4.2 තැන්පතු ගිණුම**

---------------

ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය තුල වැඩසටහනේ මධ්‍යම හා පළාත් මට්ටම සඳහා ශ්‍රීලංමබැ පවත්වාගෙන ගිය අංක 4201 තැන්පතු ගිණුමේ මෙහෙයුම් සාරාංශ කර පහත දැක්වේ.

| | <u>එජඩො</u> | <u>රු.</u> |
|---|---|---|
| මූලික තැන්පතුව | නැත | නැත |
| එකතුකළා :- ඌනපූර්ණයන් | 40,184,328 | 5,308,209,189 |
| අඩුකළා :- ආපසු ගැනීම් | 40,184,328 | 5,308,209,189 |
| | ------------ | --------------- |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | - | - |
| | ======= | ========= |

**5. විගණන නිරීක්ෂණ**

------------------

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

-----------------------------

ණය ගිවිසුමේ iv වගන්තියේ 4.04 ඡේදය අනුව, ආසියානු සංවර්ධන බැංකුවට පිළිගත හැකි ගිණුම් මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කළ යුතුවේ. කෙසේ වුවද, 2013 දෙසැම්බර් 31 දිනට පළාත් සහා නවයේ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ සියළුම අරමුදල් මූලාශ්‍රයන්ගෙන් දරණ ලද මුළු වියදම වූ රු.84,592,467,000 ක් නියෝජනය වන ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තා විගණනයට ඉදිරිපත් කර තිබුණි.

**5.2 අරමුදල් උපයෝජනය**

---------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තා හා විගණනය සඳහා ලද අනිකුත් තොරතුරු අනුව, වැඩසටහනේ මධ්‍යම හා පළාත් මට්ටම් සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් ලද එජඩො මිලියන 40 ක් වූ මුළු ණය මුදලින් වැඩසටහනේ පළාත් මට්ටම සඳහා කරන ලද වෙන් කිරීම් වෙනම අනාවරණය කර නොතිබුණි. තවද, පළාත් සහා නවයේ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ සඳහා ණය මුදල භාවිතා කිරීමට වාර්ෂික ඇස්තමේන්තුවෙන් කරන ලද වෙන්කිරීම්ද වෙනම පෙන්වා නොතිබුණි.

(ආ) පළාත් සහා නවයේ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ වල මූලධන හා පුනරාවර්තන වියදම් දැරීම සඳහා සියළුම ප්‍රභවයන්ගෙන් එකතුව රු. 89,132,217,000 ක මුළු වෙන් කිරීමක් වාර්ෂික අයවැය ඇස්තමේන්තු මඟින් වෙන්කර තිබූ බව නිරීක්ෂණය විය. එයින් බස්නාහිර, වයඹ සහ සබරගමුව පළාත් වල පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ වල මුළු වෙන් කිරීම් වලින් සියයට 5 ත් සියයට 16 ත් අතර පරාසයක එකතුව රු3,284,549,000 ක් වූ ඉතුරුම් 2013 දෙසැම්බර් 31 දිනට පැවැති බව වාර්තා විය.

## 5.3 භෞතික ප්‍රගතිය

----------------

මෙම වර්තාවේ 5.1 ඡේදයෙහි සඳහන් වන පරිදි 2013 දෙසැම්බර් 31 දිනට අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා පළාත් සභා විසින් සියළුම අරමුදල් ප්‍රභවයන්ගෙන් දරා තිබූ මුළු එකතු වියදම රු.84,592,407,000 ක් නියෝජනය වන ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන ලෙස විගණනයට ඉදිරිපත් කර තිබුණි. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු මෙහෙයුම් වලට අදාලව 2013 වර්ෂයේ පළාත් සභා විසර්ජන ගිණුම්වල සිදුකරන ලද ප්‍රධාන විගණන නිරීක්ෂණ කිහිපයක් පහත ආකාරයට නැවත ඉදිරිපත් කෙරේ.

(i). පළාත් මට්ටමේ පාසල් සඳහා ගුරුවරුන් වෙන් කිරීම සතුටුදායක ලෙස සිදුකර නොතිබුණි. පළාත් රසක දුෂ්කර ප්‍රදේශවල පාසල් ගුරු හිඟයක් සහිතව ක්‍රියාත්මක වූ අතර පළාත් නාගරික ප්‍රදේශවල පාසල් අනුමත කාර්ය මණ්ඩලයට වඩා ගුරු අතිරික්තයක් සහිතව ක්‍රියාත්මක වන බව වාර්තා විය. ලබාගත් තොරතුරු වලට අනුව, වාර්ෂික ගුරු මාරුවීම් ක්‍රමවත්ව ක්‍රියාත්මක නොකිරීම නිසා සබරගමුව, ඌව, බස්නාහිර, දකුණ හා නැගෙනහිර පළාත් වල ග්‍රාමීය පාසල්වල ප්‍රධාන විෂයන් සඳහා ගුරු හිඟයක් පවතින අතර අදාල පළාත්වල නාගරික පාසල්වල ගුරු අතිරික්තයක් පවතී.

(ii). ලබාගත් තොරතුරු වලට අනුව, පළාත් කිහිපයකම ග්‍රාමීය ප්‍රදේශවල ප්‍රාථමික සහ ද්විතීක පාසල්වල වල ශිෂ්‍ය සංඛ්‍යාව අඩු මට්ටමක පවතී. දකුණු පළාතේ 500 ට අඩු ශිෂ්‍ය සංඛ්‍යාවක් සිටින ද්විතීක මට්ටමේ පාසල් 827 ක් තිබෙන අතර මධ්‍යම පළාතේ ශිෂ්‍ය සංඛ්‍යාව 100 ට වඩා අඩු ප්‍රාථමික මට්ටමේ පාසල් 327 තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ වසා දැමූ පාසල් 2 ක් ඇතුළුව 2013 දෙසැම්බර් 31 දිනට දකුණු පළාතේ පාසල් 138 ක් වසා දමා තිබෙන බව වාර්තා විය.

(iii). මධ්‍යම පළාතේ 5 වසර ශිෂ්‍යත්ව විභාගය සමත්වීමේ ශිෂ්‍ය අනුපාතය සියයට 6.82 ක් වන අතර අනෙකුත් පළාත්වල සමත්වීමේ ශිෂ්‍ය අනුපාතය සියයට 9.5 සිට 11.5 දක්වා පරාසයක පවතී. බස්නාහිර,සබරගමුව,ඌව,උතුරු මැද පළාත්වල අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ සියළු විෂයන් අසමත් වීමේ අනුපාතය සියයට 4 සිට සියයට 8 දක්වා පරාසයක ඉහළ අගයක පවතී. තවද, වයඹ, දකුණ, මධ්‍යම, උතුරුමැද සහ බස්නාහිර පළාත්වල අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ සියලු විෂයන් අසමත් වීමේ අනුපාතය සියයට 10 සිට 16 දක්වා ඉහළ පරාසයක පැවතුණි.

(iv). ඌව හා උතුරු මැද පළාතේ පළාත් අධ්‍යයපන දෙපාර්තුමේන්තුවල මෙහෙයුම්වල ප්‍රගතිය එම අදාල දෙපාර්තුමේන්තුවල වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, කාර්යය සාධන සමාලෝචන වාර්තා වල අඩු බව නිසා විගණනයේ දී සත්‍ය ලෙස තක්සේරු කිරීමට නොහැකි විය. තවද, 2013 දෙසැම්බර් 31 දිනට නැගෙනහිර පළාත් සභාවේ අභ්‍යන්තර විගණන ඒකකය ක්‍රියාත්මක නොවන බව වාර්තා විය. අදාල පළාත් සභාවල අධ්‍යාපන අමාත්‍යාංශවල කාර්යය සාධනය සමාලෝචනය කළ හැකි වන පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නැගෙනහිර හා උතුරු මැද පළාත්වල පවත්වා නොතිබුණි.

(v). දකුණු, උතුරු මැද හා ඌව පළාත්වල අධ්‍යාපන දෙපාර්තුමේන්තු විසින් වත්කම්වල භෞතික පැවැත්ම තහවුරු කිරීම සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ 2013 වාර්ෂයේ පවත්වා නොතිබුණි.

(vi). බස්නාහිර, නැගෙනහිර, උතුරු මැද පළාත් වල පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවලට අයත් මෝටර් වාහන, පරිගණක හා අනිකුත් උපකරණ, ගුරු නිවාස ආදී වත්කම් කිහිප අවස්ථාවකම අයුතු පරිහරණය හෝ ඌන උපයෝජිතව හෝ තිබූ බව වාර්තා විය.

(vii). සබරගමුව, බස්නාහිර, දකුණු පළාත්වල පළාත් මට්ටමේ පාසල්වල තහවුරු කිරීමේ ලේඛන නොමැතිව හෝ විධිමත් අධිකාරි බලයක් නොමැතිව ගෙවීම් කිරීම, බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරිමේ අඩුපාඩු, අත්තිකාරම් දීර්ඝ කාලයක් පියවා නොතිබීම වැනි මූල්‍ය පාලනයේ දුර්වලතා කාර්ය සාධන විගණනයේදී වාර්තා විය. තවද, මානව සම්පත් කළමනාකරණය, ගුරුවරුන්ගේ නිවාඩු හා ගුණාත්මක යෙදවුම් සඳහා සුදුසු වාර්තා පවත්වාගෙන යාම, ශිෂයන්ගේ ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ රජයේ ප්‍රදාන බෙදාහැරිම සහ ගුරුවරුන්ගෙන් අපදා හා අනිකුත් ණය, නිවාස කුලී වැනි මාසික අඩු කිරිම් යන ක්ෂේත්‍රයන්හි අදාල පළාත් පාසල්වල සාමාන්‍ය පරිපාලන කටයුතු බස්නාහිර, නැගෙනහිර, සබරගමුව, උතුරු මැද හා වයඹ පළාත්වල පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවල සිදුකරන ලද විස්තරාත්මක විගණනයේදී නිරීක්ෂණය විය.